

# "හේමන්තයේදී 2" හේමන්තයේදී



සිසිර දිසානායක

මෙල්බන් පුරවරයට හේමන්තය ලබන්නා සේ දැනෙයි. ඒ ගී හේමන්තයයි. දෙවන වතාවටත් ඒ ගී හේමන්තයේදී ගීයෙන් පිනවීමට හේමන්ත සූදානම් වෙයි. ඒ හේමන්ත ඩයස් නම් වන මෙල්බන් ගී කෝකිලයායි. සෞම්‍ය හඬින් ලයාන්විතව සිය ගායනීය කුසලතාවයන් පෙන්වමින් මෙල්බන් වේදිකාවේ ඔහු ගීතවත් වන්නේ "හේමන්තයේදී" පමණක් ම නොවේ. නොයෙකුත් සද්කාර්යයන් වෙනුවෙන් ගායනයෙන් මතු නො ව රංගනයෙන් පවා ඔහු අන්‍යන් හා මුහු වූයේ අද ඊයේ නොවේ. ඒ පිළිබඳව යළිත් මතකය අවදි කරවා ගැනීමට අපි ඔහු සමඟ එක්වුනෙමු.

"මගේ පියා ගීත ගායනයට හරි දක්ෂ, ඒ වගේම ලැදි කෙනෙක්. අපේ නිවස පිහිටලා තිබුණොත් දළුගම "සරසවි" චිත්‍රාගාරය අසළ. ඒ නිසා අපේ ගෙදර ඒ දවස්වල නිතර ම මිල්ටන් පෙරේරා, නන්දා මාලනී, සරත් දසනායක, වසන්තා සඳනායක, තිලක් කරුණාතිලක, ප්‍රේමනාත් කොඩිතුවක්කු, සුජාතා අත්තනායක වගේ ප්‍රවීණයින් එන එන තැනක් බවට පත් වෙලයි තිබුණේ. තාත්තාගේ උනන්දුවත් මගේ හැකියාවත් නිසාම පුංචි කාලේ දහම් පාසැල් නාට්‍ය තරඟ ගීත ගායනා තරඟවලින් මම ජයග්‍රහණය කරල තියෙනවා."

"හැත්තෑව දශකයේ මුල් කාලයේ ගුවන් විදුලියේ "ළමා පිටිය" වාගේ වැඩසටහන්වලට සහභාගි වෙන්න ලැබීමත් මාව ගායනයට යොමු කරවන්න හේතුවක් වුණා. පියා රචනා කරලා සංගීතවත් කරපු "පුංචි පුංචි හරකා" කියන ගීතය තමයි මම මුලින් ම "සොඳුරු සෙවන" වැඩසටහනේ දී ගායනා කළේ. සිරි කුලරත්න මහත්මයා අධ්‍යක්ෂණය කරපු "පෙති ගෝමර" චිත්‍රපටයේ ළමා චරිතයකුත් රඟපාන්න අවස්ථාවක් ලැබු ණා."

හේමන්ත ඩයස් සංගීතය විෂයයක් ලෙස කොළඹ ආනන්ද විද්‍යාලයේ හැදෑරූ අතර, එකල පටන්ම ගායනයට තිබූ ලැදියාවත් ඒ නිසාම විඳි දඬුවම් පිළිබඳවත් අද සිහිපත් කරන්නේ වැඩිහිටියෙකු ලෙස සොම්නසිනි.

"මම මෙල්බන් නුවරට ආවේ 1996 දී. පොලී වීරක්කොඩි මහත්මයාගේ මාර්ගයෙන් මෙහි සිටි එල්. බී. ඒකනායක සාහිත්‍යධරයන්ට හඳුනාගන්න ලැබුණ එක විශේෂයෙන් මෙහේ කටයුතුවලට දායක වෙන්න කළ මුල පිරීමත් වුණා. ඒ දවස්වල 3''' ගුවන් විදුලියේ "සිංගරු පාය" නාට්‍යයේ ගීත් නමැති සරසවි සිසුවකුගේ භූමිකාවට පණ පොවන්න තෝරාගත්තේ මාව. ඒ වැඩ සටහනේදී මුණ ගැමුණ රෝහණ කරුණාරත්න මගේ ගායන හැකියාව හඳුනාගෙන මාව ඒ දවස්වල නිශ්පාදනය වෙමින් පැවතුන හෙන්රි ජයසේනයන්ගේ " හුණුවටයේ කතාව" මෙල්බන් දර්ශනයට සහභාගි කරගත්තා."

"එතෙන් දී මෙල්බන් නුවර ඉන්න දක්ෂ කලාකරුවක් රැසක්ම අඳුනාගන්න ලැබුණ එකත් විශේෂ සිද්ධියක්. ඒ අතරින් මාලනී හා ෂ්‍යාමේන් ජයසිංහ යුවල විශේෂයි. මේ අතර ස්වර්ණමාලී සෙනෙවිරත්න මහත්මිය සංවිධානය කළ "පින්සාර ගී" හා "සුවසෙත ගී රැස" වැනි සංගීත ප්‍රසංගවල ගී ගයන්නත් අවස්ථාව සැළසුනා. "ස්කැටිස් " සංවිධානයේ " රස කලස" වැඩ සටහන්වලදී, මගේ හැකියාව දුටු මාලනී ජයසිංහ මහත්මිය මාව ඇයගේ " බක්මහ අකුණ" මෙල්බන් නිශ්පාදනයේ " ප්‍රේමදාස" කියන චරිතයට තෝරගත්තා. මෙල්බන් රසිකයින් වැඩි දෙනෙක් මාව හඳුනාගත්තේ ඒ චරිතය නිසා. ඊට පස්සෙයි උඩවෙල මහත්තයා ස්ප්‍රිංවේල් ධම්මසරණ විහාරයේ තොරණක කවි ගායනා කරන්න මාව තෝරගත්තේ. ගරු නාඹටුන්නේ විජිත හාමුදුරුවන්ගේ මාර්ගයෙන් විහාරයට ආධාර පිණිස කළ "ස්ටාර්ස් ඔෆ් ලංකා" ප්‍රසංගයේ ගීත ගයන්නත් මග පෑදුනා."

හේමන්ත එදා මෙදා තුර මෙල්බන් හි පැවැත්වෙන පොදු කටයුතුවලදී ඉදිරිපත්වන අප අතර සිටිනා කාගේත් හිතවතෙකි. පසු කාලයකදී මාලනී ජයසිංහ මහත්මිය නිශ්පාදනයෙන් දායක වූ මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ "මනමේ", "මහාසාර" වැනි නාට්‍ය තුලින් ද අපහට ඔහුගේ රංගන කුසලතා දැකගත හැකිවිය. මහාසාර නාට්‍යයේ ගී ගයමින් කළ රංගනය සඳහා ජය ශ්‍රී චන්ද්‍රජිත් රංගන ශිල්පියාණන්ගෙන් ලද සහය ද හේමන්ත සිහිපත් කරයි.

වසර 1997 දී "එපා එන්න යළි මගේ ලෝකයට" යන සිය ස්වතාන්ත්‍ර ගීය ගයමින් හේමන්ත ඇරඹූ තමන්ගේ ගී මගෙහි සුවිශේෂී අවස්ථාවකි 2007 වසරේ පැවැත්වීමට යෙදුණු "හේමන්තයේදී 1" ගී ප්‍රසංගය. එහිදී ඔහු විසින් සිය කුළුඳුල් සංගත තැටිය ද එළි දක්වන ලදී. රවී සිරිවර්ධන, පාලිත පෙරේරා, හේමාමාලි බණ්ඩාරනායක, මේ ලියුම්කරු සහ තමන්ගේම පද රචනා සඳහා, කැමරන් කොළඹගේ, රෝහණ වීරසිංහ, කළිඳු වීරසිංහ, මහින්ද බණ්ඩාර සමඟ තමන්ගේ ම තනු යොදා නිර්මාණය වූ ගී එකතුවකි ඒ. තරුපති මුණසිංහගේ සංගීතයෙන් නිර්මාණය වූ රවි සිරිවර්ධනගේ නිබන්ධකයන් වූ "ඉතින් නිවුණා ද ළය ගිනි ?" සිනමා පටයේ තේමා ගීතය ගැයීමට එහි නිශ්පාදිකා ශිරෝමා ප්‍රනාන්දු හේමන්තට ඇරයුම් කිරීමට ද ඔහු ලද කදිම අවස්ථාවක් විය. අමරදේවයන්ගේ පටන් මෙහි පැමිණි සියලු ගායක ගායිකාවන් වෙනුවෙන් අත්වැල් ගැයීමට ආරාධනා ලැබුණු හේමන්ත සිය රසිකයින් වෙනුවෙන් මෙවර ඉදිරිපත් කරන්නට යන ප්‍රසංගය පිළිබඳව අපි විමසිලිමත් වූයෙමු.

පෙබරවාරි මාසේ 28 වැනි සෙනසුරාදා හවස 6.30ට "හේමන්තයේදී 2" ප්‍රසංගය ඉදිරිපත් කරන්නයි සූදානම. "ලුක්සෙල් බ්ලයින්ඩ්ස්" අධිපති ගාමිණි කරවිදෙණිය මහත්මයා තමයි පූර්ණ අනුග්‍රහය දක්වන්නේ. සමිත ජයතිලක ප්‍රමුඛ "සොලිඩ් ශ්‍රී" වාදක මණ්ඩලයයි සංගීතයෙන් ප්‍රසංගය සරසන්නේ. ප්‍රසංගයේ දී අසුන්තා කරුණාරත්න, සෙව්වන්දිකා අබේරත්න, විශාරද සුලානි අනුපමා, විශාරද අනුෂා නානායක්කාර, වාසනා වීරකෝන්, රුවිනි දුනුවිල, හංසිකා එදිරිසූරිය යන පිරිස ගායනයෙන් දායක වෙනවා. මගේ ගීතවලට අමතරව වෙනත් ජනප්‍රිය ගීතත් ගයනා කරන්නයි අදහස. ඉතින් ඔය දායක වෙන හැමෝට ම මම ස්තූතිවන්ත වෙනවා. මට දෙන සහයට. කලින් කී අයට අමතරව රමණී ලියනාරච්චි, දයා සිල්වා, විජිත අමරසේකර, බන්දු දිසානායක, වෛද්‍ය ඔල්ගා මෙන්ඩිස්, වජිර ඒකනායක මහත්ම මහත්මීන්වත් ආදරයෙන් සිහිපත් කරනවා."

ඉතින් අපගේ ප්‍රසංගය සුන්දර අත්දැකීමක් වේවි. එදාට ඇවිත් අපිත් එක්ක ඒ සුන්දරත්වය බෙදා හදාගන්න !" හේමන්ත සිය රසිකයින්ට ඇරයුම් කළේය. අපි ඔහුට ජය පැතුවෙමු.

---

39 වන පිටෙන්

**මේ වෙනකොට ජනතා විමුක්ති පෙරමුණ කතා කරන්නෙත් ප්‍රතිසංස්කරණ ගැන විතරයි කියන කාරණයයි විවේචකයන් ඉදිරිපත් කරන්නේ?**

ජේවීපී එක ප්‍රතිසංස්කරණවලට යටවෙලා විප්ලවය අත්හැරලා නෑ. වමේ ව්‍යාපාරය කවදාවත් ප්‍රතිසංස්කරණ ප්‍රතික්ශේප කළේ නෑ. හැබැයි ප්‍රතිසංස්කරණයෙන් ප්‍රතිසංස්කරණයට ගිහිල්ලා සමාජය සම්පූර්ණයෙන්ම හදාගන්න පුළුවන් කියලා වමේ ව්‍යාපාරයක් විදිහට අපි පිළිගන්නෙත් නෑ. ප්‍රතිසංස්කරණ ඕනේ. නමුත් අපි ප්‍රතිසංස්කරණවාදී නෑ. පාර්ලිමේන්තුව ඕනේ නමුත් අපි



පාර්ලිමේන්තුවාදී නෑ. පාර්ලිමේන්තුවාදී නම් අපි වෘත්තීය සමිති ව්‍යාපාර කරන්නේ නෑ. ගොවියෝ, ශිෂ්‍යයෝ සංවිධානය කරන්නෙත් නෑ. අපි ඒවා වෙන වෙනම සංවිධානය කරන්නේ විප්ලවය සඳහා පෙරමුණු බල ඇණි ඒවා නිසයි. නැත්නම් අපිට ශ්‍රීලංකා එක යූඑන්පී එක වගේ ඡන්ද කර කර ඉන්න පුළුවන්නේ. අපි අරහෙම කරන්නේ අපි අරමුණ අත්හැරලා නැති නිසා. අපි දැන් පාර්ලිමේන්තුව පාවිච්චි කරන්නේ වේදිකාවක් විදිහට. වමේ භූමිකාව ඒකයි. අපි විප්ලවය අත්හැරලා නෑ.

**පැරණි වම මේ වන විට එහි පැරණි නායකයන් මුල්කරගෙන ප්‍රතිලාභ පිල ලෙසත් තරුණ නායකයන් මුල්කරගෙන ප්‍රතිපත්ති පිල ලෙසත් දෙකට බෙදී තිබෙනවා. වමේ බලයක් ගොඩ නැගීමේදී ඔබලා පැරණි වමේ කොයි පිලද පිළිගන්නේ?**

අපි අපේ සමුළුවෙන් යෝජනාවක් සම්මත කර තිබෙනවා ජනතා විමුක්ති පෙරමුණ මූලිකව වාමාංශික පක්ෂ සහ අනෙකුත් ප්‍රගතිශීලී බලවේග ඒකාබද්ධ කරගත්ත පෙරමුණක් ගොඩනැගිය යුතුයි කියලා. ඒ යෝජනාවෙම තියනවා ඒ සඳහා කිසිසේත්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හෝ එක්සත් ජාතික පක්ෂය සම්බන්ද කරනොගත යුතුයි කියලා. අපි ඉදිරියේදී බලාපොරොත්තුවෙනවා පැරණි වමේ පක්ෂ සහ ඒවායින් කැඩී බිඳී ගිය කොටස් සමඟ මේ ගැන කතා කරන්න. ඒ විතරක් නොවෙයි වෙනත් ප්‍රගතිශීලී බලවේග, උගතුන්, බුද්ධිමතුන් වැනි සමාජය කෙරෙහි බලපෑමක් කළ හැකි කොටස් සමග පුළුල් සංධානයක් ගොඩනඟන්න. දැන් තියෙන්නේ ධනේෂ්වර පක්ෂ මුල්වෙලා ගොඩනැගූ සංධාන. වමේ පක්ෂ දැන් කරන්නේ ඒවා පස්සේ බඩගාන එක. තමන්ට ඒවාට බලපෑමක් කරන්න බෑ.

කොමියුනිස්ට් පක්ෂය සමසමාජ පක්ෂය හැමදාම කළේ යූඑන්පියට ගහමින් අනෙකුත් ධනපති කණ්ඩායම බදාගෙන ඒකත් එක්ක සන්ධාන ගහන එක. ඒ අයට අනුව ශ්‍රී ලංකා එක ඇතුළු අනෙකුත් ධනපති පක්ෂ ප්‍රගතිශීලියි. යූඑන්පී එක ප්‍රතිගාමියි. එහෙම විග්‍රහ කරගෙන ශ්‍රීලංකා එකෙන් ඇමැති කට්ටක් දෙකක් ඉල්ලගෙන ඒකේ එල්ලිලා ඉන්නවා. ස්වාධීනව මේ රටේ වැඩකරන ජනතාව සංවිධානය කරන්නේ නෑ. අපි කල්පනා කරනවා ශ්‍රී ලංකා එක යූඑන්පී එක මූලික කරගත් සන්ධාන වෙනුවට ජේවීපී එක මුල්වෙලා අනෙකුත් වමේ ව්‍යාපාර සමඟ සන්ධාන ගොඩනගන්න. ඒක තමයි හරි. අපි මේ රටේ වාමාංශික අනන්‍යතාවක් තියන සියළු වාමාංශික බලවේගවලින් ඉල්ලා සිටිනවා ඒ වැඩේට ප්‍රවේශයක් ගමු කියලා. ඒකට හොඳම වෙලාව දැනුයි. අපි මෛත්‍රීපාල සිරිසේන මහත්තයාගේ ආණ්ඩුවට නොයන්නේ ඔන්න ඔය ප්‍රතිපත්තියේ ඉඳන්.

**සාකච්ඡා කළේ**
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com